# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය.

சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


22/09/2014

Attention: - News Editor/Director,

**Revision of Voter Registration - 2014**

The enumeration of voters for the preparation of the 2014 voter registration has been finalized at the moment. The draft of the register is kept on public display from 3rd September to 30th September 2014. This is the last opportunity available for the general public to get verified whether their names have been included in the voter register revised for the current year. We, People's Action for Free and Fair Elections (PAFFREL), request you to make use of this opportunity for such verification, as a responsible citizens of this country.

The Department of Election has made arrangements to display the lists at the following offices

1. District Election Offices
2. Divisional Secretariat Offices
3. Local Authorities (Municipal Councils, Urban Councils and Pradeshiya Sabhas)
4. Gramaseva Niladhari Offices

Also, the 2014 draft can be accessed on the Election Secretariat's website 'www.slelections.gov.lk By entering your National Identity Card number, you can access your details.

In case, your name or your family members' names have not been taken into account, appeals can be made forthwith. For that purpose, **"a Claim Form" or "an UE Form"** can be filled and handed over to the District Election Offices concerned before the deadline of 30th September. You can also raise objections in case the names of individuals, illegible for voters, have been enumerated in the revision process.

The 2014 voter register will be applicable for the presidential election, parliamentary elections and the local authorities' elections slate to be conducted next year. Hence, it is of vital important for you to ensure your registration as voters using this last opportunity available to you.

Thanking You,

**Rohana Hettiarachchi**
**Executive Director**


**# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.**
**Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443**
**E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk**

# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය.

சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


2014.09.22

ප්‍රවෘත්ති කර්තෘ / සංස්කාරක,

## ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය 2014

2014 වර්ෂය සඳහා ඡන්දහිමියන් ගණන් ගැනීමේ මූලික කටයුතු මේ වන විට අවසන් කොට ඇත. ඊට අදාළ ලේඛන ප්‍රදර්ශන අවධිය 2014 සැප්තැම්බර් 03 වන දින ආරම්භ වූ අතර 2014 සැප්තැම්බර් 30 වන දිනෙන් අවසන් වීමට නියමිතය. ඡන්ද දායකයන්ට 2014 වර්ෂයේ ලියාපදිංචිය තහවුරු කර ගැනීමට ලැබෙන අවසන් අවස්ථාව මෙය බැවින් මෙම අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගන්නා ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ලැබූ සියළුම පුරවැසියන්ගෙන් අපි ඉල්ලා සිටිමු. ඔබගේ ලියාපදිංචිය තහවුරු කර ගැනීමට අදාළ ලේඛන පහත සඳහන් ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

1. එක් එක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය
2. එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
3. එක් එක් පළාත් පාලන ආයතනය (මහ නගර සභා/ නගර සභා/ ප්‍රාදේශීය සභා)
4. එක් එක් ග්‍රාම නිලධාරී කාර්යාලය

ඉහත ස්ථාන වලට අමතරව 2014 ඡන්දහිමි නාමලේඛන කෙටුම්පතෙහි ඔබේ නම ඇතුලත් වී ඇත්දැයි පරීක්ෂා කර බැලීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුවේ www.slelections.gov.lk වෙබ් අඩවියට පිවිසි ඔබේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කිරීමෙන් කළ හැක.

ඔබගේ/ පවුලේ සාමාජිකයන්ගේ නම් ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වී තිබේදැයි යන්න පරීක්ෂා කර බලා ලියාපදිංචි වී නොමැති නම් හිමිකම් ඉල්ලුම් කළ හැකිය. ඒ සඳහා හිමිකම් ලියාපදිංචි ඉල්ලුම් පත්‍රයක් හෝ UE ඉල්ලුම් පත්‍රයක් භාවිතා කළ හැක. එකී ඉල්ලුම් පත්‍ර ඉහත ස්ථානවලින්ම ලබාගත හැකි අතර නිසි ලෙස සම්පූර්ණ කොට 2014 සැප්තැම්බර් මස 30 දිනට පෙර අදාළ දිස්ත්‍රික් කාර්යාල වෙත යොමු කළ යුතු වේ. එමෙන්ම, සුදුසුකම් නොමැති අයෙකු ලියාපදිංචිය සඳහා යොමු වී ඇත්නම් ඊට විරෝධතා ඉදිරිපත් කිරීමට ද ඔබට හැකියාව ඇත.

එළඹෙන 2015 වර්ෂයේ ජනාධිපතිවරණය, මහමැතිවරණය සහ පළාත් පාලන ආදී මැතිවරණ කිහිපයක්ම පැවැත්වීමට නියමිත බැවිනුත්, එම මැතිවරණ සඳහා 2014 ඡන්දහිමි නාම ලේඛනය භාවිතා කරන බැවිනුත්, ඒ සඳහා ඔබට ලැබෙන ලැබෙන අවසන් අවස්ථාව මෙය බැවිනුත්, 2014 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට ඔබේ නම ඇතුලත් කර ගැනීම සඳහා අද අදම ක්‍රියාත්මක වන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

ස්තුතියි.

රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂ.


# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.

Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443

E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk